

# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2016 (නව නිර්දේශය)

### 2022 මාර්තු/අප්‍රේල්

### මානවශාස්ත්‍ර පීඨය

### සිංහල - SINH E 1015

### නූතන සිංහල සාහිත්‍ය ප්‍රවේශය

පළමුවන කොටසේ ප්‍රශ්නයත් , දෙවන හා තුන්වන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගිනුත් තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.

කාලය : පැය 03 යි.

---

## 1 කොටස

1. පහත සඳහන් පද්‍ය නිර්මාණය පිළිබඳ විචාරයක් සපයන්න.

| | |
|---|---|
| නැගිටින්න මගේ පුතුනි දැනුදු නුඹ | ප්‍රමාදය |
| නෑසේ ද කාකයන් නඟන රැදු | විලාපය |
| දවසක්ම නසාලයි පමා වන | විනාඩිය |
| අහිමි වෙයි හෙට දිනට හිමි අහර | සලාකය |
| | |
| නුඹ නැතිව රේල්ලුව හඬ හඬා | දුවාවිය |
| එය අපේ පැල උඩින් ගියා සේ | දැනේවිය |
| රේල්ලුවෙ අඟුරු දුම මිසක මුළු | දිවා රැය |
| නො පෙනේවි පැල උඩින් බත ඉදෙන | දුමාරය |
| | |
| පවුලේ වැඩිමලා නුඹ හිසට මිණි | කිරුළක් ය |
| සහෝදරයන් කිම් ද නංගිලා | තිදෙනෙක් ය |
| සැඬ කුණාටුවක් මැද මුහුදු යන | ඔරුවක් ය |
| පුත හබල තිබෙන්නේ නුඹ අතේ | පමණක් ය |
| | |
| තමන් හිස තිබුණු බර මුදා විසුරුවා | හැර |
| නැන්දලා දීග දී උන්ට දිවි දොරටු | හැර |
| නුඹෙ පියා එදා මා කැඳෙව්වේ ඔහු | වෙතට |
| ජීවිතේ සැන්දෑව පේන තෙක් | මානයට |
| | |
| ඉතින් පුත සටන් බිම නො වැදුණොත් කල් | ඇතිව |
| නුඹ නසා දමනු ඇත කාලයේ | කුණාටුව |
| එයින් මතු එම දුකම ජන්ම දායාද | කොට |
| නුඹෙ පුතු ද දකිනු ඇත ජීවිතේ | ආගාධය |
| | |
| නුඹෙ මුවින් නො ගැයුණත් ජීවිතේ තුටු | ගීය |
| පුතුට එය ගයන්නට අවකාශ දිය | යුතුය |
| ළඟ නො වෙයි දුර බලව මගේ පුත් | කුමාරය |
| නැගිටින්න නැගිටින්න දැනුදු නුඹ | ප්‍රමාදය |

## 11 කොටස

2. "නවකතාවක සාර්ථකත්වය සඳහා කථනය මෙන් ම රූපණය ද ඉවහල් වෙයි."උදාහරණ තුනක්වත් පාදක කර ගනිමින් මේ ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව විග්‍රහ කරන්න.

3. "කෙටිකතාකරුවාගේ වෑයම වන්නේ එක් අවස්ථාවක්, සිද්ධියක් හෝ මනෝභාවයක් සියුම් ව නිරූපණය කිරීම යි."සාකච්ඡා කරන්න.

4. චරිත තුනක් නවකතාවේ ප්‍රධාන චරිතයන්හි ක්‍රියාකාරීත්වයේ සංකීර්ණතා නිදර්ශනාශ්‍රයෙන් පරීක්ෂා කරන්න.

5. පහත සඳහන් කෙටිකතා අතරින් එකක් පිළිබඳ ප්‍රමාණාත්මක විචාරයක් සපයන්න.
   (අ) දඩුලේනා
   (ආ) කැනල් පාරේ නිශාචරයෝ
   (ඇ) තාත්තා
   (ඈ) මල් වඩම් අවශ්‍යයයි

## 111 කොටස

6. කොළඹ යුගයේ මුල් පරපුරට අයත් කවීන්ගේ කාව්‍ය නිර්මාණයන්හි වස්තු විෂය කාලීන සමාජ අවශ්‍යතා සපුරාලීමට සමත් වූ ආකාරය ප්‍රමාණවත් උදාහරණ පාදක කොටගෙන සාකච්ඡා කරන්න.

7. කාව්‍ය නිර්මාණයක සාර්ථකත්වය සඳහා වස්තු විෂය මෙන් ම, භාෂාව, ආකෘතිය ආදී මූලිකාංග ද බලපාන අයුරු නිදසුන් ඇසුරෙන් පරීක්ෂා කරන්න.

8. "නාට්‍ය කලාව ඊට ම අනන්‍යය ලක්ෂණයන්ගෙන් සමන්විත, සජීවී කලා මාධ්‍යයක් ලෙස සැලකිය හැකිය."උදාහරණ තුනක්වත් පාදක කර ගනිමින් මේ ප්‍රකාශය විභාග කරන්න.

9. "මනමේ නාට්‍යයෙහි, ස්ත්‍රී පුරුෂ මනෝභාවයන් මෙන් ම, ඒ ඇසුරෙන් ගොඩනැගෙන සමාජ සංකීර්ණතා සියුම් ව නිරූපණය කෙරේ." සාකච්ඡා කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)